# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 අගෝස්තු මස 06 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපිලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්ණ

01. **ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත්පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.07.23 දින අසන ලද ප්‍රශ්ණය.**

(ප්‍ර/V/(01) 13/10)

(අ) මීරිගම ඩඩ්ලි සේනානායක ආදර්ශ කණිෂ්ඨ විදුහලේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී අයථා බලපෑම් සිදුවී ඇති බව ඔබතුමා දන්නේද ?

(ආ) ඇතුලත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් දරුවන්ගෙන් 33 ක් හා අභියාචනා හරහා 02 ක්ද, ක්‍රියාන්විත රාජකාරියේ නියුක්ත අයගේ දරුවන්ගෙන් 07 දෙනෙකු ඇතුළුව 42 මූලිකව ඇතුලත් කරගන්නා බව පිළිගන්නේද ?

(ඇ) පන්තියකට 45 ක් සම්පූර්ණ කිරීමට ඉතිරි අය ඇතුලත් කරන්නේ වැඩිම ලකුණු ලබාගත් පදනම යටතේද නැත්නම් වෙනත් ක්‍රමවේදයක් මගින්ද ?

(ඈ) මෙම විදුහලේ මූලික ඇතුලත් කිරීම් වලින් පසු පැවති පුරප්පාඩු 13 ක් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුවෙන් යොමු කල ලැයිස්තු දෙකකින් ළමුන් 09 දෙනෙකු ඇතුලත් කර ඇත්තේ කෙසේද ?

(ඉ) විදුහලේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී වැඩිම ලකුණු හා පොරොත්තු ලේඛණ තුලින් ඇතුලත් කරගත් ළමුන්ගේ ලකුණු ප්‍රමාණයන් සඳහන් කරන්නේද ?

(ඊ) එම ළමුන් සම්මුඛ පරීක්ෂණ ලේඛණයට ඇතුලත්වී ඇත්ද? නැද්ද ?

(උ) වැඩිම ලකුණු යන පදනමට බැහැරව කටයුතු කිරීම ළමුන්ට කරන අසාධාරණයක් නොවන්නේද ?

(ඌ) එම අසාධාරණය සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද ?

(එ) ඒ යටතේ වැරදි කරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කිරීමට පියවර ගන්නේද ?

(ඒ) අසාධාරණයට ලක්වූ දරුවන්ට සාධාරණයක් ඉටුකරන්නේද ?

**02.** ගරු ශු. ජෝර්ජ් පෙරේරා -- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන්

**2013.07.23 දින අසන ලද ප්‍රශ්නය.** (ප්‍ර/V/(1) 13/11)

(අ) කැලණිය විවිධ සේවා සමුපකාර සමිතිය පුරා වසර 6 ක් තිස්සේ ඡන්දයක් නොපවත්වා සමුපකාර කොමසාරිස්තුමා නම් කල සභාපතිවරයෙකු යටතේ පාලනය වන බව පිළිගන්නේද ?

(ආ) මෙසේ පත්කර ඇති සභාපතිවරයා මෙම සමිතියේ සාමාජිකයෙක් නොවන බව පිළිගන්නේද ?

(ඇ) දේශපාලන හිතවත්කම් මත මෙම පත්වීම කර ඇති බව පිළිගන්නේ ද ?

(ඈ) මෙම සභාපතිවරයා යටතේ සමුපකාර සමිතිය තුල බරපතල මූල්‍ය අක්‍රමිකතා රැසක් සිදුව ඇති බව පිළිගන්නේද ?

(ඉ) දැනටමත් විවිධ පුද්ගලයින් හා සංවිධාන ඔස්සේ වාර්තා වී ඇති එකී වංචා හා දූෂණ පිළිබඳව යම් පියවරක් නොගන්නේ දේශපාලන හිතවත්කම් නිසා බව පිළිගන්නේද ?

(ඊ දිනෙන් දින පරිහානියට යන සමුපකාර සමිතිය ආරක්ෂා කර ගැනීමට අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා යම් පියවරක් ගන්නේද ?

(උ) නොඑසේනම් ඒ මන්ද ?

(ඌ) වසර 6 ක් තිස්සේ මෙම සමිතිය සඳහා ඡන්දයක් නොපැවැත්වූයේ මන්ද ?

(එ) ඉදිරියේදී හෝ ඡන්දයක් පවත්වන්නේද ? එසේනම් ඒ කවදාද ?

**03.** ගරු ශු. ජෝර්ජ් පෙරේරා -- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/V/(1) 13/12)

අ. අත්තනගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා, ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂකවරයෙකු බව දන්නේද ?

ආ. ඒ හේතුවෙන් සමුපකාර මණ්ඩලය වාර්ෂික 16.25%ක පොලියක් ලබා දෙන බව දන්වා තිබියදී, සමිතිය සතු මුදල්,ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකුවේ රුපියල් ලක්ෂ 375 ක් 15.25%පොලියක් මතද, කොළඹ ග්‍රාමීය බැංකු සංගමයේ රුපියල් ලක්ෂ 150 ක් 16%පොලිය මතද, තැන්පත් කිරීමෙන් සමිතියට වාර්ෂිකව රුපියල් 412.500/- පොලිය අහිමි වූ බව දන්නේද ?

ඇ. 2012 වසරේ සභාපතිගේ කැමැත්තට ගම්පහ දිස්ත්‍රික් බැංකු සංගමයේ තැන්පත් කරන ලද මුදල අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ තැන්පත් කිරීමෙන් රුපියල් 468,750/- ක අමතර පොලියක් ලැබුණ බව පිළිගන්නේද ?

ඈ. සමිතිය යටතේ පාලනය වන සමුපකාර ෆාමසියට ලබා ගන්නා ඖෂධ සඳහා ලැබෙන කොමිස් මුදල් සභාපති පෞද්ගලිකව තමාම ලබා ගන්නා බව දන්නේද ?

ඉ. සමිතියේ පාරිභෝගික අංශය මාසිකව රුපියල් ලක්ෂ 15 ක පාඩුවක් ලබන බව දන්නේද ?

ඊ. මෙම වංචා හා දූෂණයන්ට එරෙහිව සමිතියේ උපසභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු 2013/06/20 දින සිට තනතුරු වලින් ඉල්ලා අස්වී ඇතිබව දන්නේද ?

උ. සභාපතිවරයාගේ විෂමාචාරයන්ට එරෙහිව පියවරක් ගන්නේද ? නොඑසේනම් මන්ද ?

**04.** **ගරු නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම ගොවිජන සංවර්ධන, සුළුවාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.**

(ප්‍ර/V/(1) 13/13)

අ. පිළියන්දල නගරයේ පැවති මකද්‍රෝකා දන්සැල සහ රණවිරු උපහාර උළෙල සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් දැරූ වියදම කොපමණද ?

ආ. කුමන කාරණා සඳහාද ?

ඇ. කරුණා සමාධි පදනම හා ඔබතුමාගේ අමාත්‍යාංශය අතර සම්බන්ධය කුමක්ද ?

ඈ. එම සමාධි පදනමේ ප්‍රධාන නිළධාරීන් කව්ද ?

ඉ. ඔබතුමාගේ අමාත්‍යාංශය හා කරුණා සමාධි පදනම අතර ගිවිසුමක් තිබේද ?

ඊ. එම දන්සැල පිළිබඳව වූ පුවත්පත් වාර්තාවලට අනුව මකද්‍රෝකා ටොන් 2.2 බෙදා දුන්නේද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදනය / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**1) ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :**

**"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුල මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි." (යෝ/v(01)13/02)**

2) ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා

"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි." (යෝ/v(01)13/04)

X. සභාව කල්තැබීම:

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2013.07.23 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.